# කොළඹ විශ්වවිද්‍යාලයෙහි ලිංගික අතවරයන්ට එරෙහි ප්‍රතිපත්තිය සහ එම ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා වන පටිපාටිමය පියවර

**මෙම ප්‍රතිපත්තිය මඟින් ලිංගික අතවර වැළැක්වීමට පියවර ගන්නා අතර ලිංගික අතවරවලින් පීඩාවට පත් පුද්ගලයන් සඳහා පැමිණිලි කිරීමේ යාන්ත්‍රණයක් සපයයි. එය කොළඹ විශ්වවිද්‍යාලය යටතට ගැනෙන පුද්ගලයින්ට සහ ස්ථානවලට අදාළ වේ.**

**පොදු ප්‍රතිපත්ති**

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලු දෙනාටම ලිංගික අතවරයන්ට ලක් නොවී නිදහසේ සිටිය හැකි ඉගෙනුම් පරිසරයක් හා රාජකාරි ස්ථානයක් පවත්වාගෙන යාමට කොළඹ විශ්වවිද්‍යාලය කැපවී සිටියි. මානව ගරුත්වය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ නියමිත ක්‍රියාවලියට ගරු කිරීම යන මූලික සාරධර්ම මත පදනම්ව ලිංගික අතවර කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කිරීමටත්, කොළඹ විශ්ව විද්‍යාලය තුළ ලිංගික අතවර සිදුවීම වැළැක්වීමටත්, එවැනි සිදුවීම් පිළිබඳ විමර්ශනය කිරීමට සහ ලිංගික අතවර සඳහා දඬුවම් කිරීමට සුදුසු ක්‍රියා පටිපාටි පැනවීමටත් මෙම ප්‍රතිපත්තිය මඟින් අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකාව තුළ ලිංගික හිංසනය දණ්ඩ නීති සංග්‍රහයේ 345 වන වගන්තිය යටතේ සාපරාධී වරදක් වන අතර 1998 අංක 20 දරණ *අධ්‍යාපන ආයතනවල නවක වදය සහ සියලු ආකාරයේ හිංසනයන් තහනම් කිරීමේ පනතේ* 2 (2) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන සන්දර්භය තුළද එය සාපරාධී වරදක් ලෙස සැලකේ. තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලිංගිකත්වය පදනම් කරගෙන වෙනස් කොට සැලකීම තහනම් කිරීම 12 (1) සහ (2) වගන්ති) ඇතුළුව සමානාත්මතාවයට ඇති අයිතිය සහ නීතියේ සමාන රැකවරණය තහවුරු කරයි. එමෙන්ම නීත්‍යානුකූල රැකියාවක නිරත වීමේ නිදහස (14) (1) (උ) වගන්තිය) තහවුරු කරයි. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW) සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි (ILO) ' සේවා නියුක්තිය හා රැකියාව සම්බන්ධයෙන් වෙනස් කොට සැලකීම' යන මාතෘකාව දරන 111 වන ප්‍රඥප්තිය කෙරෙහි වන ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නෛතික බැඳීම් යටතේ ද රැකියා ස්ථානයන්හි ලිංගික හිංසනය වැළැක්වීම සහ ලිංගික අතවරයන්හි වින්දිතයන්ට පිළියම් සැපයීම අවශ්‍ය වේ.

## 1.1. අරමුණු

I. කොළඹ විශ්ව විද්‍යාලය තුළ සියලු පුද්ගලයින්ගේ ගෞරවය හා සමානාත්මතාවයට ගරු කරන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම
II. ඉලක්කගත, වැළැක්වුම් මැදිහත්වීම් හරහා ලිංගික අතවර සිදුවීම වැළැක්වීම
III. ලිංගික අතවර පිළිබඳ ශූන්‍ය සහන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ සමථකරණයන් සහ / හෝ විනය ක්‍රියාමාර්ග හරහා ලිංගික අතවර පිළිබඳ පැමිණිලි විසඳීමට යාන්ත්‍රණයන් සැපයීම

## 1.2. ලිංගික අතවර කිරීම් පිළිබඳ නිර්වචනය

වෙනත් පුද්ගලයෙකුගේ ස්ත්‍රී පුරුෂභාවය සහ / හෝ ලිංගිකත්වය මත පදනම්ව කායික, මානසික හෝ වෙනත් හානියක් හෝ චිත්ත පීඩාවක් ඇති කරන ඕනෑම ක්‍රියාවක් (ශාරීරික, වාචික, අභිනය, දෘශ්‍ය, ව්‍යංගික හෝ ලිඛිත) ලිංගික අතවර යන්නෙන් අදහස් වෙයි. එවැනි ක්‍රියාවන් ලිංගික අතවරයක් වන අතර එය විශ්ව විද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයින් (මෙම ප්‍රතිපත්තිය යටතට ගැනෙන පුද්ගලයින් සඳහා 1.4 බලන්න) ඉහත ඕනෑම ක්‍රියාවක නිරත වන විට අදාළ වේ. (උදාහරණ සඳහා විනය ක්‍රියාමාර්ගය වලට යටත්වන ක්‍රියා බලන්න - 2 කොටස)

## 1.3. පොදු හැසිරීම

මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වන සියලුම පුද්ගලයින් ඔවුන්ගේ හැසිරීම තුළ පිළිගත් ආචාර ධර්ම ප්‍රමිතීන් අනුගමනය කළ යුතු අතර ලිංගික අතවර ක්‍රියාවන්ගෙන් වැළකී සිටීම, ලිංගික අතවර ප්‍රවර්ධනය කිරීමෙන් හෝ එය දිරිගැන්වීමෙන් වැළකී සිටීම, ලිංගික අතවර කිරීම් සඟවා ගැනීමෙන් වැළකී සිටීම හා ලිංගික අතවර වැළැක්වීම සඳහා විශ්ව විද්‍යාලය විසින් සිදු කරනු ලබන උත්සාහයන්ට දායක වීම මෙන්ම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලු පුද්ගලයින්ට ගරු කිරීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමද අවශ්‍ය වේ.

එම පුද්ගලයන් විසින්, නිදසුන් ලෙස,

I. කිසියම් පුද්ගලයකුගේ රැකියාවෙහි, ශාස්ත්‍රීය අභිවර්ධනයෙහි, කාර්ය ප්‍රතිලාභයන්හි හෝ ක්‍රියාකාරකම්වල නියමයක් හෝ කොන්දේසියක් ලෙස ඍජුව හෝ ව්‍යංගයෙන් ලිංගිකත්වය ගැන සඳහන් කිරීමෙන් වැළකිය යුතුය.

II. කිසියම් පුද්ගලයකු විසින් ලිංගික බලපෑමක් ප්‍රතික්ෂේප කිරීම හෝ නොපිළිගැනීම භාවිත කරමින් එම පුද්ගලයාගේ රැකියාවට හෝ ශාස්ත්‍රීය කටයුතුවලට බලපාන පරිදි හෝ ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීමෙන් වැළකිය යුතුය.

III. කිසියම් පුද්ගලයකු විසින් ලිංගික බලපෑමක් ප්‍රතික්ෂේප කිරීම හෝ නොපිළිගැනීම භාවිත කරමින් එම පුද්ගලයාගේ රැකියාවට හෝ ශාස්ත්‍රීය කාර්ය සාධනයට බලපාන නිශේධනාත්මක බලපෑමක් සිදුවන අන්දමේ හැසිරීමකින් යුක්ත වීමෙන් හෝ තර්ජනාත්මක, සතුරු හෝ විරෝධාත්මක කාර්යාලීය හෝ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමෙන් හෝ එවැනි පරිසරයක් නිර්මාණය කරන ලෙස අන්‍යයන්ගෙන් ඉල්ලා සිටීමෙන් වැළකිය යුතුය.

IV. ලිංගික අතවර කිරීම් පිළිබඳ විධිමත් හෝඅවිධිමත් පැමිණිලි සැඟවීමෙන් වැළකිය යුතුය.

V. ලිංගික අතවර කිරීම් උදෙසා තොරතුරු හා සංනිවේදන තාක්ෂණය භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

## 1.4. මෙම ප්‍රතිපත්තිය යටතට ගැනෙන පුද්ගලයන් සහ ස්ථාන

i. විශ්ව විද්‍යාල පනත යටතේ බලය ලත් සහ කොළඹ විශ්ව විද්‍යාලයේ අනුග්‍රහය යටතේ කටයුතු කරන සියලුදෙනාම මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වෙති. (උදා: විශ්ව විද්‍යාල පරිපාලනය සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය, තාවකාලික හා බාහිර අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන්, බාහිර අධීක්ෂකවරුන් සහ විභාග පරීක්ෂකවරුන්, ඇගයීම් කමිටු සාමාජිකයින් , අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය, බාහිර සේවා සපයන්නන්ගේ සේවකයින්).

ii. විශ්වවිද්‍යාලය වෙනුවෙන් විශ්වවිද්‍යාලයෙහි අධිකාරිය යටතේ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පරිබාහිරව සිදු කෙරෙන සියලුම කාර්යයන් මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වේ.

**2. විනය ක්‍රියාමාර්ගයන්ට යටත්වන ක්‍රියාවන්**

කොළඹ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් විනය ක්‍රියාමාර්ග ගැනීමේදී ලිංගික අතවර කිරීම් ලෙස සලකනු ලබන ක්‍රියාවන් තනි තනිව හෝ කණ්ඩායමක් ලෙස පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට එරෙහිව සිදු කරනු ලබන පහත සඳහන් අන්දමේ හැසිරීම්වලින් සමන්විත වුවද මේවාට පමණක් සීමා නොවේ:

**2.1. ලිංගික අතවර කිරීම් ගනයට අයත් වන නිශ්චිත ක්‍රියාවන්**

i. වාචික, වාචික නොවන හෝ ශාරීරික හැසිරීමක ස්වරූපයෙන් එලි දැක්වෙන අනපේක්ෂිත ලිංගික බලපෑම් සහ අනවශ්‍ය ලිංගිකත්වයට නැඹුරු වූ ප්‍රකාශයන් (උදා: අසභ්‍ය අදහස්, අපහාසාත්මක බැල්ම, ලිංගිකව අදහස් සහිත අපහාස, අපවාද , ප්‍රකාශ, අභිනයන්, විහිළු, ලිපි, දුරකථන ඇමතුම්, විද්‍යුත් තැපැල (ඊමේල්), කෙටි පණිවුඩ, එම්එම්එස් සහ සමාජ මාධ්‍යවල සන්නිවේදනය)

ii. කාමුක දර්ශන පෙන්වීම, ශාරීරික සම්බන්ධතා පැවැත්වීම හෝ අතවර කිරීම හෝ ශාරීරික සම්බන්ධතා පැවැත්වීමට හෝ අතවර කිරීමට උත්සාහ කිරීම, අදාළ පුද්ගලයා නොදැනුවත්ව යම් කිසිවකු ලුහුබැඳීම හෝ එම පුද්ගලයා පිළිබඳ තොරතුරු සෙවීම ( stalking) , සිවුරුහන් කිරීම ඇතුළු ශබ්ද හෝ ලිංගික ස්වභාවයේ කිසිවක් ප්‍රදර්ශනය කිරීම

iii. ලිංගික අල්ලස් සඳහා ඉල්ලීම් කිරීම

iv. ඍජුව හෝ ව්‍යංගයෙන් දඬුවම් ලබාදෙන බවට තර්ජනය කරමින් හෝ ප්‍රතිලාභ ලබාදෙන බවට පොරොන්දු වෙමින් ලිංගික අල්ලස් සඳහා ඉල්ලීම් හෝ අණකිරීම් සිදු කිරීම

v. ලිංගික අඩන්තේට්ටම් කිරීම හෝ ලිංගික අඩන්තේට්ටම් කරන බවට තර්ජනය කිරීම

vi. ඉහත කිසියම් කරුණක් පිළිබඳ අසත්‍ය චෝදනා ඉදිරිපත් කිරීම

**2.2. පැමිණිලි සම්බන්ධව බිය ගැන්වීමේ ක්‍රියා**

මෙම ප්‍රතිපත්තිය මගින් ආවරණය වන හැසිරීම පිළිබඳව පැමිණිලි කර ඇති හෝ සාක්ෂිකරුවෙකු වන හෝ එවැනි පැමිණිල්ලක් විමර්ශනය කිරීමට සහාය වන ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව හිරිහැර කිරීමේ ක්‍රියා (උදා: අපහාස, බිය ගැන්වීම්, වෙනස් කොට සැලකීම, වින්දිතයෙකු බවට පත් කිරීම, තර්ජන, වක්‍ර හිරිහැර කිරීම්) කොළඹ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් විනය ක්‍රියාමාර්ග ගනු ලැබීමට යටත් වනු ඇත.

**3. ලිංගික අතවර කිරීම් පිළිබඳ පැමිණිලි හා ක්‍රියාපටිපාටීන්**

**3.1. යාන්ත්‍රණය**

කොළඹ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් පැහැදිලිව පෙනෙන සාක්ෂි රැස් කිරීම සඳහා මූලික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කමිටුවක් පත් කළ යුතු අතර, ඉන් අනතුරුව ලිංගික අතවර පිළිබඳ පැමිණිලි විභාග කර පරීක්ෂණ පැවැත්වූ පසුව, සුදුසු අවස්ථා වලදී ගතයුතු විනය ක්‍රියාමාර්ග උපකුලපතිවරයාට නිර්දේශ කරනු ඇත. මෙම කමිටුව ලිංගික හිංසනය පිළිබඳ විමර්ශන කමිටුව (CISH) ලෙස හැඳින්විය යුතුය. මෙම කමිටුව සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, සමාන ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාවකින් යුක්ත විය යුතුය. එමගින් විශ්ව විද්‍යාල ප්‍රජාවේ විවිධත්වය පිළිබිඹු කළ යුතු අතර අවම වශයෙන් බාහිර සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. එහි සියලුම සාමාජිකයින්ට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ සනාථ කරන ලද

වාර්තාවක් (track record) තිබිය යුතු අතර ලිංගික අතවර පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට හා විමර්ශනය කිරීමට පුහුණුව ලබා තිබිය යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී අවිධිමත් විසඳුම් ක්‍රියාවලියක් සඳහා උපකුලපතිවරයා සහ අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර මැදිහත්කරුවන් පත් කිරීමට ද CISH හට බලය ඇත.

### 3.2. පැමිණිලි ඉදිරිපත් කිරීමට අවසර ලත් පුද්ගලයන්

මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වන සියලුම පුද්ගලයින්ට (1.4 (I) බලන්න) පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. එමෙන්ම විශ්ව විද්‍යාලයට පැමිණෙන අමුත්තෙකු සහ / හෝ චූදිත වින්දිතයාට පෞද්ගලික හෝ වෘත්තීය සම්බන්ධතාවයක් ඇති තුන්වන පාර්ශවයක් හෝ සිදු කරන ලදැයි චෝදනා කරන ලද අතවරය දුටු අය විසින්ද පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. ( උදා: පවුලේ සාමාජිකයන්, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්, ශිෂ්‍ය උපදේශක)

### 3.3. පැමිණිල්ලෙහි ස්වරූපය හා ක්‍රියා පටිපාටිය

I. මෙම ප්‍රතිපත්තිය මගින් පාලනය වන පුද්ගලයෙකුට උපකුලපතිවරයාට සහ / හෝ CISH හි සභාපතිවරයාට සහ / හෝ පීය මැසිවිලි කමිටුවට ( Faculty Grievance Committee) ලිඛිත හෝ වාචික පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම මගින් විසඳුමක් ලබා ගත හැකිය. ලිංගික අතවර පිළිබඳ පැමිණිල්ල උපකුලපතිවරයාට හෝ පීය මැසිවිලි කමිටුවට ඉදිරිපත් කරනු ලැබුවහොත්, පසුව කී පුද්ගලයන් විසින් එම පැමිණිල්ල මූලික පරීක්ෂණයක් සඳහා CISH හි සභාපති වෙත ඉදිරිපත් කළ යුතු අතර පසුව අවශ්‍ය විටෙක පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

II. ඕනෑම පැමිණිල්ලක් අත්සන සහිතව ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.පැමිණිල්ල වාචිකව ඉදිරිපත් වන්නේ නම්, පැමිණිල්ල භාර ගන්නා අධිකාරිය විසින් (උදා: මණ්ඩපාධිපති, ආයතන අධ්‍යක්ෂ, පීඨාධිපති, අධ්‍යයන අංශ ප්‍රධානී, ශිෂ්‍ය උපදේශක, වැඩසටහන් සම්බන්ධීකාරක) වාචික පැමිණිල්ල ලිඛිතව සටහන් කරගත යුතු අතර සහ ඊට පැමිණිලිකරුගේ අත්සන ලබාගත යුතුය.

III. පැමිණිලිකරුවෙකුට සමථකරණය සහ / හෝ විධිමත් ක්‍රියා පටිපාටිය මගින් විසඳුමක් ලබා ගත හැකිය.

IV. මෙම ක්‍රියා පටිපාටිය මගින් පැමිණිලිකරුට කිසියම් අවස්ථාවක දී අදාළ විය හැකි ඕනෑම නීතියක් යටතේ සහනයක් ලබා ගැනීමට ඇති හැකියාව කිසිම අයුරකින් වළක්වනු නොලැබේ.

#### 3.3.1. සමථකරණය

I. පැමිණිලිකරුවෙකුට කාරණය සමථයකට පත්කර ගැනීමට සහ / හෝ එය නැවත සිදුවීම වැළැක්වීමට සමථකරණය තෝරා ගත හැකිය. සමථකරණ ක්‍රියාවලිය භාවිතා කිරීම පැමිණිලිකරු විධිමත් විනිශ්චය පටිපාටිය භාවිතා කිරීමෙන් වළක්වනු නොලැබේ.

II. මෙම සමථකරණ ක්‍රියාපටිපාටිය මගින් අදාළ ගැටළුව වඩා යහපත් තත්වයකට පත් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පැමිණිලිකරු විසින් ලිඛිත සන්නිවේදනයක් මගින් චූදිත පාර්ශවයෙන් විධිමත් ඉල්ලීමක් කරනු ලැබේ.

III. උපකුලපතිවරයාගේඋපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව CISH විසින් පැමිණිල්ලට අදාළ සියලු පාර්ශවයන්ට පිළිගත හැකි සමථකරුවන් දෙදෙනෙකු පත් කළ යුතුය. මෙයින් එක් අයෙකු අභ්‍යන්තර සාමාජිකයෙකු වියයුතු අතර අනෙකා බාහිර සාමාජිකයෙකු වියයුතුය. එමෙන්ම ඔවුන් විසින් පැමිණිල්ලට අදාළ පාර්ශවයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය ද නියෝජනය කළ යුතුය. අදාළ එක් එක් පාර්ශවයන්ගේ අවශ්‍යතා නියෝජනය කරන නිරීක්ෂකයෙකු (නීතිමය නොවන) සහ CISH හි නියෝජිතයෙකුට සමථ කටයුතු සඳහා සහභාගි විය හැක. තර්ජනාත්මක නොවන පරිසරයක් තුළ සාමූහික වගකීමකින් යුතුව සමථකරණ ක්‍රියාවලිය කරගෙන යන බවට සහතික කිරීමේ වගකීම CISH වෙත පැවරේ.

IV. දෙපාර්ශවයේම තෘප්තියට හේතු වන පරිදි සමථකරණ ක්‍රියා පටිපාටිය අවසන් කරන ලදහොත් කාරණය උපකුලපතිවරයාට වාර්තා කර සමථයකට පත් කරනු ලැබේ.

V. සියලුම පැමිණිලි සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වා ගත යුතුය. සම්මුඛ පරීක්ෂණ පටිගත කිරීම් (ඇත්නම්), සන්නිවේදනය, ලියකියවිලි සහ වාර්තා හෙළිදරව් කරනු ලබන්නේ බලයලත් පුද්ගලයින්ට පමණි.

**3.3.2. විධිමත් ක්‍රියා පටිපාටිය**

**I.** පහත දැක්වෙන අවස්ථා වලදී උප කුලපති සහ / හෝ පීඨ මැසිවිලි කමිටුවට හරහා CISH සමග ලිඛිත සන්නිවේදනය මගින් පැමිණිල්ලක් සඳහා කිසියම් පාර්ශවයක් විසින් විධිමත් ක්‍රියා පටිපාටිය ආරම්භ කළ යුතුය**:**

**අ)** කිසියම් පාර්ශවයක් තෘප්තිමත් කිරීම සඳහා සමථකරණ ක්‍රියාවලිය අසමත් වූ විට (ක්‍රියාවලිය අතරතුර හෝ අවසාන වශයෙන්)

**ආ)** කිසියම් පාර්ශ්වයක් විසින් විධිමත් විනිශ්චය පටිපාටිය මගින් පැමිණිල්ල විසඳා ගැනීමට තෝරා ගන්නා ලද අවස්ථාවක

II. උපකුලපතිවරයා සිය අභිමතය පරිදි විධිමත් ක්‍රියාවලියක් ආරම්භ කර පැමිණිල්ල CISH වෙත යොමු කළ අවස්ථාවක

III. පැමිණිල්ල ලැබී මාස දෙකක් ඇතුළත CISH විසින් තම මූලික විමර්ශනය සහ පැහැදිලිව පෙනෙන සාක්ෂි හමු වුවහොත්, එහි විමර්ශනය සම්පූර්ණ කළ යුතු අතර එහි වාර්තාව සහ නිර්දේශ උපකුලපති වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් අනතුරුව උපකුලපතිවරයා විසින් වාර්තාව පිළිබඳ සිය නිර්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා එය විශ්වවිද්‍යාල පාලක සභාවට ඉදිරිපත් කළ යුතුය.

IV. මූලික විමර්ශනය කරන CISH සාමාජිකයින් තදනන්තර පරීක්ෂණයට සහභාගි නොවිය යුතුය.

V. ද්වේෂ සහගත ව්‍යාජ පැමිණිල්ලක් කර ඇති බව CISH විසින් සොයා ගනු ලැබුවහොත් ඒ පිළිබඳව උපකුලපතිවරයාට වාර්තා කළ යුතු අතර උපකුලපතිවරයා විසින් ඒ පිළිබඳව සලකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාවට

ඉදිරිපත් කළ යුතුය.කෙසේ වෙතත්, ලිංගික අතවරයක් පිළිබඳ පැමිණිල්ලක් ඔප්පු කිරීමට ඇති නොහැකියාව ව්‍යාජ පැමිණිල්ලක් ලෙස නම් නොකළ යුතුය.

VI. ලිංගික අතවර පිළිබඳ පැමිණිල්ලකට පැමිණිලිකරුගේ ලිංගික ඉතිහාසය සහ / හෝ ලිංගික දිශානතිය කිසිම අවස්ථාවක අදාළ නොවේ.

VII. කිසියම් පැමිණිල්ලක් විසඳීම සඳහා සලකා බලන විට, පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීමට හෝ පැමිණිලි ක්‍රියාවලිය කිසියම් ආකාරයකින් අත්හිටුවීමට පැමිණිලිකරු බිය ගැන්වීමට හෝ අනවශ්‍ය ලෙස බලපෑම් කළ හැකි කිසිදු ක්‍රියාකාරකමක් කරගෙන යාමට හෝ සිදු කිරීමට පැමිණිලි පාර්ශවයන්ට අවසර නොදේ. මෙම කාලය තුළ පොදුවේ අදාළ පාර්ශ්වයන් අවම සම්බන්ධතා පවත්වා ගැනීම අවශ්‍ය වේ.

**VIII.** මෙම ප්‍රතිපත්තියේ සඳහන් කිසිවක් විසින් මෙම ප්‍රතිපත්තියේ විෂය පථයට අයත් වන සහ විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහය යටතේ බරපතල විෂමාචාරයක් ලෙස සැලකෙන හැසිරීමක් සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමෙන් උපකුලපතිවරයා වලක්වනු නොලැබේ.

IX. නියමිත ක්‍රියාපටිපාටිය තුළ සිදු කෙරෙන කිසිම සොයාගැනීමක් හෝ එළඹෙන කිසිම නිගමනයක් නිසා අදාළ විය හැකි කිසිදු නීතියක් ක්‍රියාවේ යෙදීම නොවැලකෙයි.

**4. ලිංගික අතවර වැලැක්වීම**

I. සමස්ත විශ්ව විද්‍යාල ප්‍රජාවටම මෙම ප්‍රතිපත්තියට ප්‍රවේශය ලබාගත හැකි අතර මෙය සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ බ්‍රේල් යන භාෂාවලින් ලබා ගත හැකි වේ. එමෙන්ම මෙය ශිෂ්‍ය අත්පොත්, විශ්ව විද්‍යාල දින දර්ශනය සහ විශ්ව විද්‍යාල වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කෙරේ.

II. මෙම ප්‍රතිපත්තිය හා සාමාන්‍ය චර්යාධර්ම සංග්‍රහය පිළිබඳ වගන්තියක් සියලුම කාර්ය මණ්ඩල කොන්ත්‍රාත්තු හා පත්වීම් ලිපිවල ඇතුළත් කළ යුතුය.

III. මෙම ප්‍රතිපත්තිය විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන අදාළ සියලුම කාර්ය මණ්ඩල සංවර්ධන හා දිශානති වැඩසටහන් වලදී සාකච්ඡා කරනු ලැබේ.

IV. අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වන විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන හා පුහුණු වැඩසටහන් වල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සහ සේවා ස්ථානයේ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදීතාව වර්ධනය කිරීම සඳහා නිර්මාණය කරන ලද සංරචකයක් ඇතුළත් වේ. එවැනි වැඩසටහන් වලට මෙම ප්‍රතිපත්තිය පිළිබඳ සැසියක් ඇතුළත් වේ.

V. විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගම්වල ඕනෑම ව්‍යවස්ථාවකට මෙම ප්‍රතිපත්තිය හා නවක වදය සහ අධ්‍යාපන ආයතනවල සියලු ආකාරයේ හිංසනයන් තහනම් කිරීමේ පනත පිළිබඳ යොමුවක් ඇතුළත් වියයුතු වේ.

VI. බාහිර සේවා සපයන්නන් සමඟ විශ්ව විද්‍යාලය විසින් අත්සන් කරනු ලබන සියලුම සේවා කොන්ත්‍රාත්තු වලට, එවැනි කොන්ත්‍රාත්තු වලට එළඹෙන ඕනෑම පාර්ශවයක් මෙම ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටින බව සඳහන් විධිවිධාන ඇතුළත් විය යුතුය.

VII. ලිංගික අතවර වැළැක්වීම සහ එහි ප්‍රතිවිපාක විසඳීමට විශ්වවිද්‍යාලය විසින් පුහුණු උපදේශන සේවාවක් සැපයිය යුතුය. මෙම ප්‍රතිපත්තිය යටතේ කරන ලද පැමිණිල්ලකට අදාළ ඕනෑම පාර්ශවයකට මෙම සේවාව ලබා දිය යුතුය.